Archaeologia (2006) : 9 - 15

# සීගිරිය බෞද්ධ පූජනීය ස්ථානයක් ද?

එච්. ඩී. බස්නායක
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
e-mail: sanjeewab-2000@yahoo.com

## හැඳින්වීම

ලොව පුරා සීගිරිය ප්‍රකට වී ඇත්තේ විනෝදකාමී සංචාරකයන්ගේ පාරාදීසයක් වශයෙනි. මීට ප්‍රධාන හේතුව වී ඇත්තේ සීගිරිය 1 වන කාශ්‍යප රජු හා එකට බැඳී පැවතීමයි. මහාවංසය පවසන අන්දමට කාශ්‍යප රජු ආලකමන්දාවේ කුවේරයා ලෙස විසූ බව සඳහන් වන බැවිනි. පැරණි සාහිත්‍යයෙහි දක්වෙන අන්දමට කුවේරයා විනෝදකාමීත්වයට නැඹුරු වූ යක්ෂාධිපතියෙකි. මහාවංසයේ එන මේ තොරතුරු නිසා සම්ප්‍රදායානුකූලව සීගිරිය අභාගාමීක වූ විනෝදයට බර වූ ස්ථානයක් ලෙස හඳුන්වා ඇත. එහෙත් ක්‍රි.ව පස්වන සියවසේ දී සීගිරිය කාශ්‍යප රජුගේ වාසස්ථානය වීමට පෙර බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ වාසස්ථානයක් වශයෙන් පැවති බවට සාධක ඇත. සීගිරිය යන නාම භාවිතවීමට ආරම්භ වී ඇත්තේ කාශ්‍යප රජු ක්‍රි.ව පස්වන සියවසේ දී සීගිරි පර්වතය සිය අගනුවර කොටගෙන, පර්වත මස්තකයෙහි රාජ මාළිගාවක් තනා එම මාළිගයට ඇතුල්වන දොරටුව විශාල සිංහ රූපයකින් සැරසූ හෙයිනි. එහෙයින් සිංහ + ගිරි > සීගිරි වූ බව පෙනේ. මේ පර්වතය සීගිරිය වීමට පෙර එනම් ක්‍රි.ව පස්වන සියවසට පෙර යම් කිසි වෙනත් නාමයකින් හැඳින් වූ බවට කිසිදු සැකයක් නැත.

## මුල්කාලීන භික්ෂු වාසස්ථාන

සීගිරි පර්වතය වටා පිහිටි, දැනට සොයාගෙන ඇති ගල්ලෙන් 27 ක කටාරම් කොටා ඉන් 10 ක බ්‍රාහ්මී අක්ෂරවලින් ලියූ කෙටි ලිපි ද සඳහන් වේ. මේ ලිපි ක්‍රි.පූ 3 වන සියවසේ සිට ක්‍රි.ව 1 සියවස දක්වා කාලයට අයත් වේ. මේ ලෙන්වලින් හා ලිපිවලින් පැහැදිලි වන්නේ ක්‍රි.පූ තුන්වන සියවසේ සිට සීගිරිය ජනාවාසව පැවතුනා පමණක් නොව මේ පෙදෙස භික්ෂු වාසස්ථානයක් වශයෙන් පැවති බවය. එසේ නම් සීගිරි පෙදෙස කාශ්‍යප රජු පැමිණෙන්නට පෙර භික්ෂු වාසස්ථානයක්ව පැවති බව පැහැදිලි වේ. ක්‍රි.පූ. තුන්වන සියවසේ සිට එනම් බුදුසමය ශ්‍රී ලංකාවට පැමිණි මුල් අවධියේ සිට සීගිරිය බෞද්ධ භික්ෂූන්ගේ වාසස්ථානයක් වශයෙන් පැවතිණ. ක්‍රි.ව පළමුවන සියවස වන විට බෞද්ධ භික්ෂූන් වහන්සේලා ලෙන්වල වාසය කිරීම බෙහෙවින් අඩු වී

යැමත් සමඟ සීගිරියේ බෞද්ධ මුහුණුවර ක්‍රමයෙන් තුනී වී ගිය ද කිසිදාක බෞද්ධාගමෙන් ඈත් වූ පෙදෙසක් බවට පත් නොවූ බවට සාධක ඇත.

ක්‍රි.පූ. 1 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ සිදු වූ ආගමික පෙරළිය හේතුකොටගෙන භික්ෂූන් වහන්සේලා වනවාසී හා ග්‍රාමවාසී යනුවෙන් දෙකොටසකට බෙදියැම හේතු කොට ගෙන භික්ෂූන් වහන්සේලා වැඩි වශයෙන් ග්‍රාමවාසී වීමට පටන් ගත් බව පෙනේ. බෞද්ධ ගිහි ජනතාව ද වනවාසී ලෙන්වල විසූ භික්ෂූන්ට ඇප උපස්ථාන ආදිය කිරීම් අඩුවීම ද, භික්ෂූන් වහන්සේලාගේ ලෙන් ජීවිතය අත් හැරීමට එක් කාරණක් විය.

ක්‍රි.ව. 1 සියවසේ සිට ක්‍රි.ව. 5 සියවස දක්වා කාලය තුළ සීගිරියේ තත්ත්වය පිළිබඳ සාහිත්‍යමය හෝ පුරාවිද්‍යාත්මක තොරතුරු සොයා ගැනීමට මෙතෙක් නොහැකි වී ඇති බැවින් මේ වකවානුව තුළ සීගිරියේ ඉතිහාසය පිළිබඳ කිසිවක් දැන ගැනීමට නොහැකි වී තිබේ. සීගිරියට කාශ්‍යප රජු පැමිණීමට පෙර මේ භූමිය පිළිබඳ අනුරාධපුරයේ විසූ ජනතාව දැන සිටි බව පැහැදිලි වේ. අනුරාධපුරයෙන් ඇරඹී බුදු සමය ඉතා සීඝ්‍රයෙන් සීගිරිය තෙක් විහි දී ගොස් එම පෙදෙස බෞද්ධ භික්ෂූන්ගේ වාසස්ථානයක් බවට පත් වූයේ නම්, සීගිරිය පූර්ව කාශ්‍යප යුගයේ දී අනුරපුර වැසියන් නොදැන සිටින්නට ඇතැයි සිතිය නො හැකි ය.

## පෞරාණික නාම

ක්‍රි.ව. 5 සියවසේ දී සීගිරියට මේ නම භාවිතා වන්නට පෙර මේ අරුම පුදුම පර්වතය හැඳින්වූයේ කෙබඳු නමකින් ද යන්න නවමත් රහසකි. එහෙත් ක්‍රි.ව. 5 ට පෙර මේ ස්ථානය හැඳින් වූ නාමය ගැන ඉඟියක් සොයාගත හැකි වී තිබේ. දේවානම්පියතිස්ස රජුගේ (ක්‍රි.පූ. 250-210) අභිෂේකෝත්සවය සඳහා පහළ වූ යන සම්පත් අතර 'චාතවාතපබ්බ' නම් ස්ථානයකින් උණ දඬු තුනක් පැන නැගී ආ බව මහා වංශයේත්, දීපවංශයේත් සඳහන් වේ. චාතපබ්බතය පිහිටි ස්ථානය ගැන විවරණයක් කරන මහාවංස ටීකාව චාතවාතපබ්බතය අනුරාධපුරයට දෙයොදුනක් ගිණිකොණින් පිහිටා තිබූ බව දක්වයි. එපමණක් නොව සද්ධාතිස්ස රජතුමා චාතවිහාරය නමින් විහාරයක් ද මෙතැන්හි කරවූ බව ද දක්වේ. මේ හැර බෙන්තොට සද්ධාතිස්ස හිමිපාණන් හා ශ්‍රී ඤාණේශ්වර හිමිපාණන් විසින් සංස්කරණය කරන ලද සද්ධර්මාලංකාරයෙහි දේවානම්පියතිස්ස රජුගේ අභිෂේකෝත්සවයට නටගත් උණදඬු තුන පැන නැගී ආයේ සීගිරියේ යයි සඳහන් වේ. එහෙත් සද්ධර්මාලංකාරයේ වෙනත් සංස්කරණවල මෙය 'සැගිරි' හෝ 'සාගිරි' යනුවෙන් දක්වා ඇත. සද්ධර්මාලංකාරය ගම්පල සමයේ දී

රචිත ග්‍රන්ථයකි. කෙසේ වෙතත් 'වානපබ්බත' යනු සීගිරිය නම් සීගිරි පෙදෙස ප්‍රාග් බෞද්ධ යුගයේ දී පවා ජනාවාසව පැවති සුප්‍රකට පෙදෙසක් බව හැඳින්විය හැකි ය.

'වානපබ්බත' යනුවෙන් වංශ කථාවන්හි සඳහන් පර්වතය දඹුල්ල යයි පරණවිතාන මහතා කියයි. ඔහු කරුණු තුනක් මත පිහිටා එම නිගමනයට එළඹී ඇත. එනම් දඹුල්ලේ එක් ලෙන් ලිපියක සඳහන් වී තිබෙන 'වනවතාවෙන' යන්නෙහි 'වන' යන්න දඹුල්ලට ව්‍යවහාර වූ නම යයි පරණවිතාන මහතා කියයි. ඔහුගේ දෙවැනි සාධකය වනුයේ දඹුලු විහාරයේ කොටා ඇති ලිපියේ සඳහන් වන 'ගම්නිතිස' යන්නෙන් හැඳින්වෙන්නේ සද්ධාතිස්ස රජුගේ යයි කියන පරණවිතාන මහතා වංසකථාවෙහි දක්වෙන සද්ධාතිස්ස රජු වානපබ්බතයෙහි ඉදිකළ විහාරය දඹුලු විහාරය යයි පෙන්වයි. පරණවිතාන මහතා තුන්වන කරුණ වශයෙන් ඉදිරිපත් කොට ඇත්තේ මග බ්‍රාහ්මණ නම් තැනැත්තෙක් හා ධාතුසේන රජු අතර ඇති වූ සංවාදයක් පිළිබඳ කථාවකි. මේ කථාවට අනුව ධාතුසේන රජු රජමාළිගාවක් තැනීමට කඳු ශිඛරයක් සෙවූ බව කියවෙයි. ඒ සඳහා සුදුසු කඳු ශිඛරයක් ඇත්තේ 'යවකොල' නම් ස්ථානයට පස් ගව්වක් ගිණිකොණින් බව මේ කථාවේ දක්වේ. එම කථාවේ එන 'යවකොල' දඹුල්ල යයි ඒ මහතා දක්වයි. පරණවිතාන මහතා දක්වන මේ කථාව ගැමි පුවතක් බැවින් කෙතරම් දුරට ඓතිහාසික දැයි නිගමනය කිරීම අපහසුය. කෙසේ වෙතත් 'වානපබ්බත' යන්න පිළිබඳ මතභේද පවතින බැවින් ඒ සීගිරිය දැයි නිගමනය කිරීමට තවත් සාධක සොයාගත යුතුවේ. සීගිරිය අවට ඇති ලෙන් ලිපිවලින් මුල් අවධියේ දී ඊට භාවිත වූ නම කුමක් දැයි සොයා ගැනීමට තුඩු දෙන කිසිදු සාධකයක් මේ වන තුරා හමු වී නොමැත. ඊට භාවිත වූ නම කුමක් වුවත්, මුල් අවධියේ දී සීගිරිය භික්ෂු වාසස්ථානයක් වශයෙන් නම් පැවති බව නම් පැහැදිලිය.

### බුද්ධාභිෂේකය

මුල් අවධියේ දී මෙසේ පැවති බෞද්ධ මුහුණුවර දුබලව ගොස් ඇත්තේ කාශ්‍යප රජුගේ අවධියේ දී බව පෙනේ. ඊට හේතුව වන්නට ඇත්තේ මහාවංශ කතුවරයා ඉදිරිපත් කරන කාශ්‍යප රජු පිළිබඳ පුවත තරමක් දුරට අනාගමික පැත්තට බර වී ලෞකිකත්වයට නැඹුරුවීමය. කෙසේ හෝ කාශ්‍යප රජු සීගිරියේ පැවති බෞද්ධ වාතාවරණය ඉවත් කිරීමට කිසිදු පියවරක් ගත් බවට සාධක නොමැත. එහෙත් සීගිරි පර්වතයට සැතපුමක් පමණ දුරින් පිහිටි පිදුරංගල පර්වතය බෞද්ධ ආරාමයක් වශයෙන් පැවතිණ. සීගිරි චිත්‍රවල මල් වට්ටි රැගත් කාන්තා රූපවලින් නියෝජනය කෙරෙන්නේ මලුන් පිදුරංගල විහාරයට ගමන් කරන වනිතාවන්ගේ විලාශය යි. ඇතැමුන් පැවසීමට තුඩු දී ඇත්තේ ද මේ විහාරය ඊට නුදුරින් පිහිටා තිබීමයි. මේ හැර සීගිරියේ කාශ්‍යප රජතුමා රජ කරන සමයෙහි ඒ රජුගේ සෙන්පති තැන්පත්

මිගාර බුද්ධාභිෂේකයක් පැවැත්වීමට කාශ්‍යප රජුගෙන් අවසර ඉල්ලූ නමුත් ඊට අවසරය නොලැබීම නිසා කාශ්‍යප රජු හා මිගාර සෙන්පතියා අතර ආරවුලක් ඇති වීමට හේතු වූ බව ද චූලවංශයේ සඳහන් වෙයි. මෙම බුද්ධාභිෂේකය පැවැත්වීමට පිළියෙල කළේ කොහේද යන්න පිළිබඳ වංසකථාවේ නො දක්වුව ද, ඇතැම් විට සීගිරියේ වීමට ඉඩ තිබේ. මේ කරුණෙන් ද පැහැදිලි වන්නේ සීගිරියේ පැවති පැරණි බෞද්ධ මුහුණුවර මුළුමනින්ම කාශ්‍යප යුගයේ දී අතුරුදහන් නොවී පැවති බවයි. සීගිරි කාශ්‍යපයන්ගෙන් පසු මුගලන් රජවීමෙන් අනතුරුව මිගාර සෙන්පතියා එම උත්සවය පැවැත්වූ බව ද සඳහන් වේ. එපමණක් නොව මුගලන් රජු සීගිරිය නැවත අත්පත් කර ගැනීමෙන් පසු එය බෞද්ධ සිද්ධස්ථානයක් බවට පත් කොට එහි විහාරයක් ඉදි කරවා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට පැවරූ බව චූලවංශය කියයි. මුගලන් රජු සීගිරියෙහි දල්හ හා දාඨාකොණ්ඩඤ්ඤ නමින් විහාරද්වයක් කරවා ඒවා ධම්මරුචි හා සාගලික නිකායික භික්ෂූන් වහන්සේලාට පැවරූ බව සඳහන් වේ. තවද රජතුමා සීගිරියෙහි පබ්බත විහාරයක් කරවා එය දීඝසන්ද විහාරවාසී මහානාම හිමියන්ට පූජා කළ බව ද චූලවංශය කියයි.

## පබ්බතවිහාර

චූලවංශයේ දක්වෙන යට කී විහාරය ඉදිකිරීම පුරාවිද්‍යා සාධකවලින් ද හෙළි වී තිබේ. මෑතක දී කරන ලද කැණීම් මගින් පබ්බත විහාර වර්ගයට අයත් සංඝාරාමයක නටබුන් සීගිරි පර්වත ප්‍රාන්තයෙහි බටහිර දිගින් සොයා ගෙන ඇත. සීගිරි බලකොටුවට බටහිර දොරටුවෙන් ඇතුළු වී දකුණට කාශ්‍යප රජුගේ විනෝද උද්‍යානය නමින් හඳුන්වන කොටස පසු කරත් ම හමුවන කඳු බෑවුමෙහි දකුණුපස ඇති නටබුන් සංකීර්ණයෙහි පබ්බත විහාර වර්ගයට අයත් සංඝාරාමයක ලක්ෂණ තිබේ. ස්තූපයක, පිළිමගෙයක් හා බෝධිඝරයක් පැහැදිලිවම සොයා ගෙන ඇත. ස්තූපය ඉතා කුඩා පිහිටි කළු ගලක් ආශ්‍රිතව ගොඩ නගා ඇති අතර පිළිමගෙය සඳහා උපයෝගී කරගෙන ඇත්තේ ස්වභාවික ලෙනකි. මේ ලෙන සීගිරි කාශ්‍යප රජුගේ කාලයට පෙර සිට භික්ෂු වාසස්ථානයක් වශයෙන් පැවති බවට සාධක ඇත. එහි කටාරම් කෙටූ ලක්ෂණ පමණක් නොව බ්‍රාහ්මී අක්ෂරවලින් කෙටූ ලිපියක් ද දක්නට ලැබේ. මෙය නිශ්චිත වශයෙන් පිළිමගෙයක් යැයි නිගමනය කිරීමට තුඩු දෙන ප්‍රධාන සාධකය වන්නේ එහි ගලින් තැනූ හිටි බුදු පිළිමයක අවශේෂ හමු වීමයි. මේ බුදු පිළිමයෙහි හිස වෙන් වී ඇත. කඳ කොටස පමණක් දැනට එම ලෙනෙහිම තැන්පත් කොට ඇත. පිළිමයේ ප්‍රතිමා ලක්ෂණ වලට අනුව එය අනුරාධපුර යුගයේ මැද භාගයට පමණ අයත් බව පෙනේ. කෙසේ වෙතත් මෙම සංඝාරාමය විනෝද උද්‍යානය පසු කරත් ම ඊට යාබදව පිහිටුවා තිබීම ඉතා වැදගත් ය. බස්නාහිර දොරටුවෙන් සීගිරි පර්වතය වෙත පා නැගිය යුත්තේ මෙම විහාරාරාම පසු කරමිනි. එනැවින් සීගිරි ගලට නැගීමට පෙර මෙම විහාරය වැඳ පුදා ගෙන යන්නට ඇතැයි අනුමාන

කළ හැකි ය. දැනට සීගිරියේ ජල උද්‍යාන නමින් හැඳින්වෙන කොටස පසු කරත් ම හමුවන්නේ ශිලා උද්‍යානය නමින් හැඳින්වෙන කොටසයි. ශිලා උද්‍යානයට පිවිසීමට දොරටුවක් ද ඇත. පියගැට පිළිපෙළකින් ශිලා උද්‍යානයට නැග්ග විට මෙම ආරාමයෙහි ලෙන් විහාරයෙහි තැන්පත් කොට ඇති බුදුපිළිමය ඇසට ලක්වේ. මේ අයුරින් මෙම ස්ථානයම සංඝාරාමය සඳහා තෝරාගෙන ඇත්තේ සීගිරි ගලට නැගීමට පෙර විහාරයට නොනැගී බුදුන් වැඳ එහි විසූ භික්ෂූන් වහන්සේලාගෙන් උපදෙස් ලබාගෙන ගලට නැගීම බව පෙනේ. සීගිරි කාශ්‍යප හා මුගලන් යන රජවරුන් විසින් සීගිරියෙහි ඉදිකරන ලද සංඝාරාම 10 වෙනි සියවස තෙක් නිරුපද්‍රිතව පැවති බවට සෙල්ලිපි සාධක හමු වී ඇත.

අනුරාධපුරයේ අභයගිරියෙන් ලැබුණු සෙල්ලිපියක "සිහගිරි මහ සෑ" යනුවෙන් සඳහන් වේ. මේ වකවානුවේ දී සීගිරියේ පිහිටා තිබූ ආරාමයන්හි ධම්මරුචික හා සාගලික යන නිකායික භික්ෂූන් වහන්සේලා පමණක් නොව මහා විහාරික භික්ෂූන් වහන්සේලා ද වාසය කළ බවට සාධක ඇතැයි මේ පිළිබඳව පර්යේෂණයක් කළ මහාචාර්ය රණවීර ගුණවර්ධන (1978) මහතා පෙන්වා දී ඇත.

### සීගිරිය හා මහජනතාව

කෙසේ වෙතත් ක්‍රි.ව පස්වන සියවසෙන් පසු සීගිරිය බලකොටුවක් හා අගනුවරක් වශයෙන් පැවති තත්ත්වය සහමුලින්ම වෙනස්ව ගියද එතැන් සිට සියවස් 7 ක් පමණ ගතවන තුරු සීගිරිය ඉතිහාසයෙන් මැකී නොගොස් ජනතා අවධානයට යොමු වූ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් වශයෙන් පැවති බවට දැනට හමුවී ඇති සීගිරි කුරුටු ගී දෙස් දෙයි. මුගලන් රජුගේ රාජ්‍ය කාලයේ සිට 13 වන සියවස පමණ වන තෙක් ජනයා සීගිරියට විනෝද චාරිකාවක් වශයෙන් පැමිණි බව සීගිරි කැටපත් පවුරේ කුරුටු හා ඇති කුරුටු ගීවල සඳහන් වේ. පරණවිතාන (1956) මහතා මේ කුරුටු ගී සමූහයෙන් 685 ක් පමණ පිටපත් කොට "සීගිරි ග්‍රැෆිටි" යනුවෙන් ඉංග්‍රීසි බසින් සකස් කොට ඇති සංග්‍රහය මේ යුගයේ ඉතිහාසය පිළිබඳ තොරතුරු අනාවරණය කරයි. මේ කැටපත් පවුරේ කුරුටු ගී ලිවීමේ දී එක්තරා විධිමත් ක්‍රමයකට අනුව ගී රචනා කොට ඇති බව පරණවිතාන මහතා කියයි. කුරුටු ගීවලට අනුව මේ වකවානුව තුළ දී සීගිරියට මුළු දිවයිනේ පිහිටි විවිධ පළාත්වලින් විවිධ තරාතිරම්වලට අයත් ජනයා පැමිණි බවට සාධක දක්වේ. ඔවුන් සීගිරි පර්වතයට නැග පර්වතයෙහි බටහිර පසෙහි පිහිටි ලෙනක ඇඳ තිබූ චිත්‍ර, එසේ ම ඒ අවට සිටි නාරිකා විය හදවත්වලට නිතැතින්ම ගලා ආ අදහස් ගීයකට පෙරළා කැටපත් පවුරේ රචනා කොට ගිය බව පෙනේ. මේ ජනතාව අතර ගිහි, පැවිදි එසේ ම ඇපා, මාපා, ගුරු, වෙද ආදී උසස් පෙළේ අය පමණක් නොව වෙළඳුන්, ඇත්ගොව්වන් වැනි අය ද වූ

බව ගීවලින් අනාවරණය වේ. සීගිරි කැටපත් පවුරෙහි මෙම ගී රචනා කිරීමේ දී අන් අයටත් ගී රචනා කිරීමට ඉඩකඩ සලසමින් ගී ලියා ඇති බව කාට වුවද පෙනේ. මේ අන්දමින් බලන විට සීගිරිය නැරඹීමට පැමිණි අයට මෙසේ නම් සිතැඟියාවන් රචනා කොට තැබීමට උදව් උපදෙස් ඇතැම් විට මේ ආරාමයේ වැඩසිටි භික්ෂූන් වහන්සේලාගෙන් ලැබෙන්නට ඇතැයි ද සැලකිය හැකිය. මේ යුගයේ දී සංවේදීතාව, ක්‍රමවත්ව ජන කාර්යයක් මෙහෙයවීමට හැකියාවක් තිබුණේ ද බෞද්ධ භික්ෂූන් වහන්සේලා තුළ පමණි. කෙසේ හෝ සීගිරිය කාශ්‍යප රජුගේ යුගයෙන් (ක්‍රි.ව. 475-497) පසු 13 වන සියවස පමණ දක්වා සීගිරියේ බෞද්ධ විහාරාරාම පැවති බව පෙනේ. මෙම විහාරාරාම අභාවයට ගොස් ප්‍රදේශය වනගතවීම ඇරඹෙන්නට ඇත්තේ කවර කරුණු නිසාද, යන්න නිශ්චිත වශයෙන් පැවසීමට අපහසු වුව ද, පොළොන්නරු රාජධානියේ බිඳ වැටීමෙන් පසු දිවයිනේ හටගත් දේශපාලනමය අස්ථාවරත්වය ද ඊට බෙහෙවින් බලපාන්නට ඇතැයි සිතිය හැකිය. දිවයිනේ රාජධානි නිරන්තරයෙන් වෙනස්වීමත්, එසේම එම අසහනකාරී තත්ත්වය තුළ ජනතාව සිය පදිංචි ස්ථානය වෙනස් කිරීමත්, නිසා සීගිරි පෙදෙස ද කැලෑවෙන් වැසෙන්නට ඇතැයි සිතිය හැකිය.

කෙසේ හෝ සීගිරිය පිළිබඳ නැවතත් ඓතිහාසික ලේඛනයන්හි සඳහන් වීමට 16 වන සියවසේ දී ආරම්භ වී තිබෙනු පෙනේ. මන්දාරම් පුවත නම් ග්‍රන්ථයේ සීගිරිය ද පිහිටි රටේ තිබූ නගර අතර එක් නගරයක් වශයෙන් සඳහන් වේ. එසේම 16 වන සියවසේ අග භාගයේ දී I විමලධර්මසූරිය රජු (ක්‍රි.ව. 1592-1604) විසින් මර්දනය කරන ලද සිව් සක්තික ගම්මාන ලේඛනයට සීගිරිය ද හසුවී තිබේ. එබැවින් නැවතත් සීගිරිය මහනුවර යුගයේ දී කලඑළි බැස්ස බව පෙනේ. II රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1627-1679) පෘතුගීසින් සමඟ කළ ගන්නොරුව සටන සඳහා සීගිරියෙන් ද යුධ භටයන් රැස්කර ගත් බව මන්දාරම්පුර පුවතෙන් හෙළිවේ.

### නිගමනය

අද සීගිරිය විනෝදය සඳහා යන එන්නන්ගේ මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රකට වී තිබුණ ද ඈත අතීතයේ සිටම සීගිරිය බෞද්ධ පූජනීය ස්ථානයක් වශයෙන් පැවති බව යටකී කරුණුවලින් පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


De Silva, R. 2002 *Sigiriya and Its Significance: A Mahayana - Theravada Buddhist Monestery*, Bibliotheque,SriLanka.

Gunawardane, R. A. L. H 1978 *Robe and Plough: Monasticism and Economic Interest in the Early Medieval Sri Lanka*, Association of Asian Studies, TUCSON

Paranavitana, S 1956 *Sigiri Graffiti*, being Sinhalese Verses of the English Ninth and Tenth Centuries, London.